සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

47	S	I

Grade 11 - Pre-Evaluation – August 2022
අනාවරණ පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2022 අගෝස්තු

කාලය : පැය 3
Time: 3 hours

Appreciation of Sinhala Literary Texts
සිංහල සාහිත්‍ය රසාස්වාදය I,II
අනාවරණ පරීක්ෂණය

me: - ..... *class: -*..... *Index no: -* .....

- උපදෙස්
  I හා II පත්‍රය සඳහා පිළිතුරු සපයා සම්පූර්ණ කාලය අවසානයේදී වෙන වෙනම භාරදිය යුතුය.
  I පත්‍රය සඳහා පිළිතුරු මෙම පත්‍රෙය්ම ලිවිය යුතුය.
  II පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට උත්තර ලියන පොත භාවිතා කරන්න.

I කොටස

(සියලුම ප්‍රශ්න වලට පිළිතුරු මෙම පත්‍රෙය්ම ලියන්න.

1) (i) සිට (v) තෙක් කොටස් කියවා, ඒවා ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

(i) මං ශාසනයෙහි ඇළුම් තැන සිවුරු හරිමි.

(අ) මෙම පාඨය ඇතුළත් මුල් කෘතිය නම් කරන්න.

.....

(ආ) එම පාඨය අන්තර්ගත පාඩම කුමක්ද?

.....

(ii) මල්ලී යි ඔස පිරිමදිමින් ඔහු මා ඇමතුවෙය.

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද ?

(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් කෘතියේ නම කුමක් ද ?

(ii) කෙල්ල තෝ චණ්ඩාල එකක් ද අවශේෂ හීන ජාතියෙ එකක් ද ?

(අ) මෙම කෙල්ල යනුවෙන් ආමන්ත්‍රණය කෙරෙන්නේ කාට ද?

(ආ) මෙම ප්‍රකාශය කරන තැනැත්තිය කුමන රජුගේ බිසව ද?

(v) රැදුරු ගිනි කන්දක් ගත් සදෙහි — වනතුරු
මිතුරු වේය දිගසක් හමන — මදුමරු
මිතුරු නැසීමට එම වෙයි — පසමිතුරු
මිතුරු නැ කෙනෙක් නිවතුන් — හටකවුරු

(අ) ඉරි ඇදිපදවල අර්ථය ලියන්න.

(ආ)පළමු පද පේළියේ අර්ථය ලියන්න.

(v) (අ) තුංමං හංදිය නවකතාවේ කතුවරයා කවුද?

(ආ) තුංමං හංදිය නවකතාවේ අවසන් වන්නේ කුමන සිදුවීමකින්ද?

(ලකුණු 4x5=20)

(2) පහත දැක්වෙන ගද්‍ය පද්‍ය කොටස් දෙකෙන් ඒක් කොටසකට පමණක් පිළිතුරු සපයන්න.

ඒකල ඔවුන් විසින් සැබව දේවයන් වහන්ස අධර්මකාරි කෙනෙක් නැත වංශ පරිපාලනය කරන්නට නිසි දරු කෙනෙක් නැත්තාහ. අනික් කෙනෙක් අප රාජ්‍යය ඇරගෙන අධර්මයෙන් රාජ්‍යය නසති. ඒ කාරණයෙන් දැහැමෙන් රාජ්‍යය කරන්නට නිසි පුතණු කෙනෙකුව් පැතුව මැනවැයි. කීහ. එය රජ්ජුරුවෝද දරුවන් ප්‍රාර්ථනා කරන්නා වූ මා විසින් කුමන කටයුතු දැයි විචාළාහුය. දේවයන් වහන්ස තුන් වහන්සේ ගේ තුන්වැදෑරුම් වූ නාටක ස්ත්‍රීන්ගෙන් පළමු කොට රැකවල් ඇතිව පිටත ඉන්නා වූ සුළු නැ මුළු රැකවල් හැර ස්ත්‍රීන් සිත් සේ ඇවිදනාව හැර වදාළ මැනව ඉදින් ඉන් එක් කෙනෙක් දරු කෙනෙකුත් ලද්දා නම් මැනව නැත්නම් ඉක්බිති අගමෙහෙසුන් බිසවුන් වහන්සේ හැර අවශේෂ ස්ත්‍රීන් හළ මැනව ඒකාන්තයෙන් මෙතෙක් දෙනා අතුරෙන් කුසල් ඇති කෙනෙක් දරු කෙනෙකුන් ලබතියි කිවාහුය. එකල රජ්ජුරුවෝ ඔවුන්ගේ බසින් එලෙස කරවාත් දරු කෙනෙකුන් නොලදින් නොසතුටු වූහ.

(i) කතා ප්‍රවෘත්තියට අනුව ජනතාවගේ ප්‍රාර්ථනාව කුමක්ද? (ලකුණු 04)

(ii) දරු කෙනෙකුන් ලැබීමට නිබිය යුතු ගුණාංග මොනවාද? (ලකුණු 04)

(iii) පරිපාලනයට අවශ්‍යයැයි කියන්නේ කවරෙක්ද පැහැදිලි කොට ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 06)

(iv) මෙම කොටස අයත් ජාතක කතාව අවසන් වන්නේ කෙබදු ආකාරයෙන් දැයි ඔබේ වචනයෙන් ලියන්න.

(ලකුණු 06)

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

47	S	I II

Grade 11 - Pre-Evaluation – August 2022
අනාවරණ පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2022 අගෝස්තු

කාලය : පැය
Time: hours

Apprciation of Sinhala Literary Text - II
සිංහල සාහිත්‍ය රසාස්වාදය - II

Name: - ..... class: -..... Index no: - .....

- පළමුවන ප්‍රශ්නය ද 2,3,4,5 ප්‍රශ්න වලින් තෝරාගත් ප්‍රශ්න දෙකක් ද ඇතළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.
- මෙම පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට පිළිතුරු ලියන පොත භාවිත කරන්න.

1. පහත සඳහන් පැදි පෙළ කියවා දී ඇති ප්‍රකාශ උපයෝගී කොට ගෙන වචන 200 කින් පමණ රසාස්වාදයක් ලියන්න.

විවිරි විරි විවිරි විරි උදේ සිට ඇද — හැලෙන
පොද නොකැඩී තෙත බරිව හිරිකිතෙන් — කිලිපොලන
පාර තොට ගහ කොල ද වසාගෙන හැම — අතින
වහින වැහි වහින වැහි නොපායන මුළු — දවස
ගොහොරු මඩ ඇඟිලි කරු අතර විරි විරි — ගාන
මඩිනි හැම තැනම මඩ පාට දිය — රැඳුන
අළුත් පස් දැමූ පාර දනිහ තෙක් මඩ — එරෙන
බැනියම ද ඇහට ඇලි උදේ සිට තෙත — බරිව

තෙමුන රෙදි ඇඟ ඇලුණ හබුරු කොල — මලිපිටිද
දෝර ගොස් හැම තැනම වක්කලන් ඇලි — හැදුන
හැට්ට අත් කඳ කලව තෙත රෙද්ද ඇඟ — එතුව
වහින වැහි තද සුළඟ නොපායන මුළු — දවස

(අ) මෙම පැදි පෙළට පාදක වූ අත්දැකීම
(ආ) මෙම පද්‍ය පන්තියට කවියා යොදාගත් අත්දැකීම්
(ඉ) මෙම පද්‍ය පන්තියේ භාෂා භාවිතය
(ඊ) මෙම පද්‍ය පන්තියෙන් පෙන්වන සමාජ තත්ත්වය
(උ) පද්‍ය පන්තිය තුළින් ජීවිතයේ යථාර්ථය (ලකුණු 6x5=30)

PAST PAPERS WIKI

2. ජාතක කතාකරු පබාවතිය කෙරේ පාඨක සිත් තුළ උපහාසය කුළුගන්වයි. පැහැදිලි කරන්න. (ලකුණු 15

3. මිනිස් දුර්වලතා හාස්‍යය උපහාසය ධ්වනිත වන ලෙස ඉදිරිපත් කොට ඇත. උදාහරණ දෙමින් (ලකුණු 15
කරන්න.

4. කපටි වෙළෙන්දාගේ උපාය ඥානය පිළිබඳ ඔබේ අදහස දක්වන්න. (ලකුණු 15

5. ඉයෝනා ශෝකය දරා ගනිමින් ජීවිතයේ යථාර්ථයට මුහුණ දේ. පැහැදිලි කරන්න. (ලකුණු 15

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

ගන්තුන තුලානේ අලියා වැටුණු	වැවේ
සුන්දරහාමි ඒතරම් පොහොසතෙක්	නොවේ
තුන්ලාහකම බිම වැඩකර දියෙන්	වැවේ
රන්වන් කරල් බරවී බිමට	නැවේ

ඔහුගේ ගමට මා ගිය ඒ පළමු	වර
තවමත් සිතේ ඇත අමතක නොවන	යුර
හේනට ගොසින් ගෙන් හුවක් තරම	දුර
ඒනවා දිවිමි මිටි බැඳගෙන වියළි	දර

දරටික තබා සෙවණැති පලු ගසක	යට
පිසදම දමා දාඩිය එන නළල	පිට
මා එන තුරුම සිට පෙන්වූ සිනහ	කට
තවමත් පෙනේ දුක් දොම්නස් අතර	මට

(i) සුන්දරහාමි හමුවට පැමිණි ආගන්තුකයාට ලැබුණු ප්‍රතිචාර කෙබඳුද? (ලකුණු 04)

(ii) අතීතයේ මිතුම් ඒකකයක් මෙහි දැක්වේ. ඒම මිතුම් ඒකකය නම් කරන්න. (ලකුණු 04)

(iii) සුන්දර හාමිගේ දැකිය හැකි චරිත ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iv) කවියෙහි ඇති ආකාරයට කයෝර බව පෙන්වන කරුණු කෙටියෙන් ලියන්න. (ලකුණු 06)